.

පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව - සබරගමුව - සතිපාසල

**විෂය - ප්‍රායෝගික හා තාක්ෂණික කුසලතා**

**ශ්‍රේණිය - 7**

**මාසය - අගෝස්තු සතිය - 03**

**සැකසුම - කලාප අධ්‍යාපන කාර්යාලය-බළන්ගොඩ**

03 ආරම්භක තාක්ෂණවේදය

3.1 සරල ඉලෙක්ට්‍රොනික උපාංග භාවිත කරමු

**ශිෂ්‍ය කාර්යය -**

- පාඩම හොඳින්අධ්‍යයනය කරන්න.(කියවීම් පොතේ පිටු අංක77)
- අමාරු/අපහසු පාඩම් කොටස් වැඩිහිටියෙකු /ගුරුවරයකු විමසා අවබෝධ කරගන්න.
- ඔබේ කියවීම් පොත සඳහන් ක්‍රියාකාරකම් සිදුකරන්න.
- ක්‍රියාකාරකම් සිදුකිරීමේදි ඔබට එන ගැටළු ඔබේ යහළුවන්, වැඩිහිටියන් හා ගුරුවරුන් සමඟ සාකච්ඡා කර විමසුම් ලබා ගන්න.

**මෙම පාඩමට ආදාළව උපකාර කරගත හැකි ඉගනුම් ආධාරක-|**

**https://www.youtube.com/watch?v=3TYkwzgQsoI**

**මෙම පාඩම තුළින් ලබාගත හැකි ඉගණුම් ඵල-**

- ශක්ති පරිවර්තනයන් සිදු වන බව දැන ගනියි
- පරිපථ අග්‍ර වෙනස් කර භ්‍රමන දිශාවන් වෙනස් කල හැකි බව දැන ගනියි
- සරල පරිපථයක් සකස් කරයි.

**ඇගයීම / තක්සේරුකරණ ක්‍රමවේදය හා ආකෘතිය-**

පහත ප්‍රශ්ණ වලට පිළිතුරු සපයන්න

1. පහත දැක්වෙන උපාංග සපයා ගන්න.
   - වියළි කෝෂයක්
   - කුඩා මෝටරයක්
   - වයර් කැබලි දෙකක්
   - කුඩා ප්ලාස්ටික් බඹර පෙත්තක්

   පහත පියවර අනුගමනය කර බඹර පෙත්ත කරකවමු.
   A. කුඩා මෝටරයට වයර් දෙක සම්බන්ධ කරන්න.
   B. වයර් දෙකෙහි අනෙක් අග්‍ර දෙකට වියළි කෝෂය සම්බන්ධ කරන්න.
   C. කුඩා ප්ලාස්ටික් බඹර පෙත්ත මෝටරයේ කැරකෙන දණ්ඩට සවි කරන්න.
   D. වයර් කැබලි දෙක වියලි කෝෂයට සම්බන්ධ කරන්න. සිදුවන වෙනස ලියන්න
   E. වයර් කැබලි දෙක කෝෂයෙන් වෙන් කොට අග්‍ර මාරු කර නැවත සම්බන්ධ කරන්න. සිදුවන වෙනස ලියන්න
   F. විදුලි මෝටරයේ අග්‍ර දෙකට සම්බන්ධ කර ඇති වයර් දෙක එම අග්‍ර දෙකෙන් ගලවා එකිනෙක මාරු කර සම්බන්ධ කරන්න. සිදුවන වෙනස ලියන්න
   G. මෙහිදී ඔබ මුහුණ දුන් අපහසුතා මොනවාද?
2. එමඅපහසුතාව මගහරවා ගැනීමට ගත හැකි ක්‍රියාමාර්ගය කුමක්ද?

ඒ සඳහා සුදුසු පරිපථයක රූප සටහනක් අඳින්න